PAFFREL

# ජනාධිපතිවරණය කල්දැමිය හැකිද?

ශ්‍රී ලංකාවේ පැවැත්වෙන මැතිවරණ පිළිබඳව අවිනිශ්චිතා වරින් වර මතුවෙමින් තිබේ. ඊට ප්‍රධානතම හේතුව වී ඇත්තේ ඉතිහාසයේත් වර්තමානයේත් බලයේ සිටි හා සිටින පාලකයන් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් නොසලකා තම තමන්ගේ බලපැවැත්ම උදෙසා මැතිවරණ සිතියම වෙනස් කිරීමයි.

එය 1982 ජේ.ආර් ජයවර්ධන ජනාධිපතිවරයාගේ නිල කාලය තුළ පාර්ලිමේන්තු මැතිවරණය කල්දැමීම සඳහා ජනමත විචාරණයක් පැවැත්වීම 1988 සිට 2015 වර්ෂය දක්වා පළාත් සභා ඡන්ද විමසීම්ද 1991 සිට 2018 වර්ෂය දක්වා පළාත් පාලන ඡන්ද විමසීම්ද කොටස් වශයෙන් පවත්වා එහි වාසිය ලබාගැනීමට ඒ ඒ පාලකයින් කටයුතු කිරීම, 1988, 1999, 2010 සහ 2015 ජනාධිපතිවරණ කල් ඇතිව පැවැත්වීම, 2015-2019 කාලය තුළ මැතිවරණ ප්‍රතිසංස්කරණ භාවිත කරමින් පළාත් පාලන ඡන්ද විමසීම වසර දෙකහාමාරකින් ප්‍රමාද කිරීම, එම කාලය තුළම වර්තමාන ජනාධිපතිවරවයාගේ යෝජනාවක් අනුව පළාත් සභා ඡන්ද විමසීම් ක්‍රමය සංශෝධනය හරහා පළාත් සභා වසර 5 කට වැඩිකාලයක් අද දක්වාම කල්දැමීම, 2023 වසරේදී වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ අභිමතය අනුව පාර්ලිමේන්තු විසින් සම්මත කරන ලද පළාත් පාලන ඡන්ද විමසීම් සඳහා වූ අරමුදල් නිකුත් නොකිරීම මගින් පළාත් පාලන ඡන්ද විමසීම මේ දක්වාම වසරකට වැඩි කාලයක් කල්දැමීමට ලක්කිරීම වැනි අත්දැකීම් හරහා මේ රටේ බහුතර ජනතාවට නියමිත පරිදි මැතිවරණය පැවැත්වේදැයි සැකසංකා මතුවීම පුදුමයට කරුණක් නොවේ. මේ මොහොතේත් කුමන හෝ උපක්‍රමයක් යොදාගනිමින් මැතිවරණය කල්දැමීමට කටයුතු කිරීමට ඉඩ ඇතැයි බොහෝ දෙනා විශ්වාස කරති. එමෙන්ම මේ මොහොතේ ආණ්ඩු කරන පාර්ශව දෙක (එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ) අතර ඇතිවී තිබෙන සංවාදයද එවැන්නකි.

එය ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව හෝ ජනතාවගේ ඡන්ද අයිතිය පිළිබඳව හෝ සම්බන්ධයෙන් වූ සාකච්ඡාවක් නොවේ. එය කුමන මැතිවරණ / ඡන්ද විමසීම්, කුමන පාර්ශවයකට වාසිසහගත දැයි යන්න පිළිබඳ සංවාදයකි. එය අවසන් වනුයේ ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන්, ජනතාවගේ නාමයෙන් හා දේශීයත්වයේ නාමයෙන් එහෙත් සැබෑ ලෙසම බල අරගලයේ ශක්තිමත් පාර්ශවය ජයග්‍රහණය කරවමිනි. මෙම ලිපියේ අරමුණ වනුයේ එවැනි පරිසරයක් තුළ ඉදිරි මැතිවරණ පිළිබඳ ජනතාව තුළ දේශපාලනඥයන් තුළ ඇති කුකුස යම් තරමකට හෝ සමථයකට පත්කිරීමයි.

***ජනාධිපතිවරණ දිනය තීන්දු කිරීමට ජනාධිපතිවරයාට හෝ ආණ්ඩුවට හෝ බලතල තිබේද?***

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරණය පැවැත්වීමේ අවස්ථා දෙකක් පැහැදිලිව දක්වා තිබේ.

1. නිල කාලය අවසන්වීමට වසරකට පෙර (දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පෙර වසර දෙකකට පෙර) ජනාධිපතිවරයා විසින් ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත්කිරීම
(1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - 31 (3අ) (අ) අනු ව්‍යවස්ථාව අනුව)

2. ජනාධිපතිවරයාගේ නිල කාලය අවසන්වීමෙන් පසුව සාමාන්‍ය පරිදි පැවැත්වෙන මැතිවරණය
31 (3) අනු ව්‍යවස්ථාව

නිල කාලය අවසන්වීමට පෙර ජනාධිපතිවරයා ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනතාවගේ සෘජු ඡන්දයෙන් වසර පහක ධුර කාලයක් සඳහා පත්වන ජනාධිපතිවරයෙකුට සිය ප්‍රථම නිල කාලය අවසන්වීමට වසරකට පෙරාතුව 1978 ව්‍යවස්ථාවේ 3 වන සංශෝධනයට අනුව (වසර 4 ක ධුර කාලයක් සම්පූර්ණ වීමෙන් පසු) (19 වන ව්‍යවස්ථා සංශෝධනයට පෙර ධුර කාලය වසර 6 ක් වූ අතර වසර 2 කට පෙරාතුව) මැතිවරණය ප්‍රකාශයට පත්කිරීමට තම අභිමතය පරිදි ජනාධිපතිවරණය කැඳවීමේ බලය හිමිවන අතර එවැනි අවස්ථාවකදී ජනාධිපතිවරයාගේ එම අභිලාෂය ජනාධිපතිවරයා තෝරාපත්කරගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාව වෙත කෙරෙන නියමක් වන්නේය.

මේ මොහොතේ බලයේ සිටිනු ලබන්නේ ජනතාව විසින් සෘජුව තෝරාපත්කරගත් ජනාධිපතිවරයෙකු නොවන අතර එවැනි අවස්ථාවකදී ජනාධිපතිවරයාට ඒ පිළිබඳ කිසිදු අභිමතයක් නොමැත. ඔහු ඉල්ලා

PAFFREL

අස්වුවද එවැනි අවස්ථාවකදී ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව වෙනත් අයෙකු ඉතිරි ධුර කාලය සඳහා පත්කරගනු විනා මැතිවරණයට යාමේ ඉඩකඩක් නොමැත.

## ජනාධිපතිවරයාගේ නිල කාලය සම්පූර්ණවීමත් සමග පැවැත්වෙන මැතිවරණය

ඉදිරි මැතිවරණය ජනාධිපතිවරයාගේ නිල කාලය අවසන්වීමෙන් පසු පැවැත්වෙන මැතිවරණයක් බැවින් එහි සියලු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මැතිවරණ කොමිෂන් සභාවට පැවරෙන්නේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (3) අනු ව්‍යවස්ථාව අනුව බලයේ සිටින ජනාධිපතිවරයාගේ ධුර කාලය අවසන්වීමට පෙර මසකට නොඅඩු සහ මාස දෙකකට නොවැඩි කාලසීමාව තුළ නව ජනාධිපතිවරයා තෝරාපත්කරගත යුතුය. එමෙන්ම ජනාධිපතිවරයා තෝරාගැනීම සඳහාවූ 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත්කරගැනීම පිළිබඳ පනතේ 2 වගන්තියට අනුව මැතිවරණය ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව දින 16 ක් හා දින 21 ක් අතර දිනයක් නාමයෝජනා දිනය වශයෙන් නම් කළ යුතුය. නාමයෝජනා ලබාගැනීමෙන් අනතුරුව අවම වශයෙන් සති 4 ක් සහ උපරිම වශයෙන් සති 6 ක් ප්‍රචාරණ කටයුතු වලට ලබාදිය යුතුය. එමෙන්ම නාමයෝජනා භාරගැනීමෙන් අනතුරුව සති දෙකක් ඇතුළත ඒ ඒ අපේක්ෂකයන්ගේ සලකුණු හා මැතිවරණ දිනය මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතුය. මැතිවරණ දිනය ප්‍රකාශයට පත්කිරීමේදී එය පසලොස්වක පොහොය දිනයක් හෝ ප්‍රසිද්ධ නිවාඩු දිනයක් (1971/29 දරන නිවාඩු පනත) නොවිය යුතුය. එහෙත් මැතිවරණ කොමිෂන් සභාව දින තීන්දු කිරීමේදී ශ්‍රී ලංකාවේ ආගමික සංස්කෘතික දින, ජාතික විභාග හා සෙසු සුවිශේෂී කරුණු ද සැලකිල්ලට ගෙන දින නියම කරනු ලබයි.

ඒ අනුව මැතිවරණ කාල සටහන පහත පරිදි පෙළගැස්විය හැකිය.

**1. වර්තමාන ජනාධිපතිවරයාගේ නිල කාලය අවසන් වීම 2024 නොවැම්බර් 18 දිනය.**

**2. ඒ අනුව නව ජනාධිපතිවරයා 2024 ඔක්තෝබර් 17 දිනට පෙර තෝරාපත්කරගත යුතුය. ඡන්ද ගණනය කිරීම හා ප්‍රකාශයට පත් කිරීමට ගතවන කාලය සලකා බැලූ විට එය ඔක්තෝබර් 15 ට පෙර දිනයක් වීමට බොහෝ දුරට ඉඩ ඇත. එමෙන්ම යම් හේතුවක් මත ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක් හෝ අවලංගු කිරීමට සිදුවුවහොත් නැවත එම මධ්‍යස්ථාන වල ඡන්දය පැවැත්වීම සඳහා ගතවන කාලයද මෙහිදී සැලකිල්ලට ගනු ඇත. කෙසේ වෙනත් එම දිනය තීන්දු කිරීම මුළුමනින්ම මැතිවරණ කොමිෂන් සභාව සතු බලයක් හා අයිතියකි.**

**3. නාමයෝජනා දිනය මැතිවරණය ප්‍රකාශයට පත් කරන දින සිට දින 16 සිට දින 21 අතර දිනයක් විය යුතුය. තවද පෙ.ව. 9.00 පෙ.ව. 11.30 දක්වාවූ කාලය තුළ නාමයෝජනා පත්‍ර පිළිබඳව විරෝධතා ඉදිරිපත් කිරීමටද කාලය වෙන් කළ යුතුය.**

**4. ප්‍රචාරණ කටයුතු නාමයෝජනා භාරගත් දින සිට අවම වශයෙන් දින 28 ක් හා උපරිම වශයෙන් දින 42 ක්වේ.**

**ඒ අනුව උපරිම කාලය ලබාගනිමින් මැතිවරණය ප්‍රකාශයට පත් කළහොත් සම්පූර්ණ මැතිවරණ ක්‍රියාවලියටම දින (21+42) 63 ක් ගතවන අතර අවම කාලය සලකා බැලුවහොත් (16+28) දින 44 කි.**

**මැතිවරණ කොමිෂන් සභාව මැතිවරණය ඔක්තෝබර් 17 පවත්වන්නේ යැයි උපකල්පනය මත උපරිම කාලය දින 63 ක් ගනු ලැබුවහොත් මැතිවරණය ප්‍රකාශයට පත්කිරීම අගෝස්තු මස දෙවන සතියේ වියහැකි අතර එම උපකල්පනය මත අවම දින ගනු ලැබුවහොත් මැතිවරණය ප්‍රකාශයට පත්කිරීම සැප්තැම්බර් මුල් සතිය තුළ විය හැකිය.**

**මැතිවරණ කොමිෂන් සභාව සැප්තැම්බර් 18 මැතිවරණය පවත්වන්නේ යැයි උපකල්පනය කළහොත් හා උපරිම කාලය ගනු ලැබුවහොත් මැතිවරණය ප්‍රකාශයට පත්කිරීම ජූලි තෙවන සතියේ ආරම්භයේ විය හැක. එමෙන්ම සැප්තැම්බර් 18 මැතිවරණය පවත්වන්නේ යැයි උපකල්පනය මත අවම දින 44 ක් සලකා බලනු ලැබුවහොත් අගෝස්තු පළමු සතිය තුළ මැතිවරණය ප්‍රකාශයට පත්කල හැකිය.**

ඒ අනුව කුමන පදනමක් යටතේ ගණනය කරනු ලැබුවද මැතිවරණය ප්‍රකාශයට පත්කිරීම ජූලි මස තෙවන සතියේ සිට සැප්තැම්බර් මුල් සතිය දක්වා ඕනෑම කාල පරාසයක් තුළ සිදුකළ හැකිය.

පසුගිය ජනාධිපතිවරණ ප්‍රකාශයට පත්කිරීම හා ලබාදුන් කාල වකවානු පිළිබඳව පහත වගුවෙන් අවබෝධ කරගත හැකිය.

| වර්ෂය | නිලකාලය අවසන්වීමට නියමිතව තිබූ /තිබෙන දිනය | මැතිවරණය ප්‍රකාශයට පත්කල දිනය | නිල කාලය අවසන්වීමට දින කීයකට පෙර මැතිවරණය ප්‍රකාශයට පත්කලේද? | නාමයෝජනා දිනය | මැතිවරණය ප්‍රකාශයට පත්කල දින සිට නාමයෝජනා සඳහා දින කීයක් ලබාදී | ප්‍රචාරණ කාලය | මැතිවරණ දිනය | ප්‍රකාශයට පත්කර දින කීයක් ඇතුළත මැතිවරණය පැවැත්වූයේද ? | නිලකාලය අවසන්වීමට දින කීයකට ප්‍රථම මැතිවරණය පවත්වා තිබේද? |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1982 | | 1982/08/30 | | 1982/09/17 | දින 18 | 31 | 1982/10/20 | දින 51 | |
| 1988 | 1990/02/02 | 1988/10/21 | දින 469 | 1988/11/10 | දින 20 | 37 | 1988/12/19 | දින 59 | දින 410 |
| 1994 | 1995/01/02 | 1994/09/17 | දින 138 | 1994/10/07 | දින 20 | 31 | 1994/11/09 | දින 53 | දින 54 |
| 1999 | 2000/11/12 | 1999/10/28 | දින 381 | 1999/11/16 | දින 19 | 33 | 1999/12/21 | දින 54 | දින 327 |
| 2005 | 2005/12/12 | 2005/09/19 | දින 84 | 2005/10/07 | දින 18 | 39 | 2005/11/17 | දින 59 | දින 25 |
| 2010 | 2011/11/19 | 2009/11/27 | දින 722 | 2009/12/17 | දින 20 | 38 | 2010/01/26 | දින 60 | දින 662 |
| 2015 | 2016/01/27 | 2014/11/21 | දින 432 | 2014/12/08 | දින 17 | 29 | 2015/01/08 | දින 48 | දින 384 |
| 2019 | 2020/01/09 | 2019/09/18 | දින 113 | 2019/10/07 | දින 19 | 38 | 2019/11/16 | දින 59 | දින 54 |
| 2024 | 2024/11/16 | ? | ? | ? | ? | ? | ? | ? | ? |

ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමයට ජනාධිපති ධුරය හඳුන්වාදෙනු ලැබුවේ 1978/02/04 දින වන අතර 2015 දක්වා වූ කාලය තුළ ජනාධිපති ධුර කාලය වසර 6 ක් විය. 2015 ට පෙර බලයේ සිටි ජනාධිපතිවරයාට වසර දෙකකට පෙර ජනාධිපතිවරණයක් කැඳවීමේ බලය හිමිවූ අතර 2015 වර්ෂයෙන් පසු එය වසරක් දක්වා අඩුවිය.

මෙම ලේඛනයට අනුව ප්‍රචාරණ කටයුතු සඳහා ලබාදී ඇති කාලය දළ වශයෙන් සති 5 ක් බව පෙනීයයි. එමෙන්ම නිල කාලය අවසන්වීමට පෙර මැතිවරණයන් පවත්වා ඇති කාල රාමු සලකා බැලූ විට පෙනීයන්නේ සාමාන්‍ය තත්ත්වයන් යටතේ කැඳවා ඇති ජනාධිපතිවරණ වලදී (1994,2005,2019) නිල කාලය අවසන්වීමට දින 54, දින 25, දින 19 හා දින 54 ආදී ලෙස මැතිවරණ කැඳවා ඇති බවයි. ඒ අනුව වර්තමාන ජනාධිපතිවරයාගේ නිල කාලය අවසන්වී ඊළඟ ජනාධිපතිවරයා පත්වීම 2024 ඔක්තෝබර් 17 වන දින ප්‍රථම සිදුවිය යුතුය. ඉහතින් සඳහන් කර ඇති උදාහරණ අනුව මේ දක්වා ජනාධිපතිවරණයක් කැඳවීම වෙනුවෙන් ලබාගෙන ඇති අවම කාලය දින 19 කි. ඒ අනුව මීළඟ ජනාධිපතිවරණය සැප්තැම්බර් මස අවසාන සතිය වන විට පැවැත්වීමේ වැඩි ඉඩකඩක් ඇත. (එය අනිවාර්යය නොවේ. මේ පිළිබඳව තීරණ ගැනීමේ පූර්ණ බලය මැතිවරණ කොමිෂන් සභාව සතුවේ.)

| **ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ** | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| වර්ෂය | නාමයෝජනා බාරගත් දිනය | ප්‍රචාරණ කාලසීමාව | මැතිවරණ දිනය | ඡන්දය ප්‍රකාශ කල ප්‍රතිශතය | ජයග්‍රාහී අපේක්ෂකයා ලැබූ ප්‍රතිශතය | ලියාපදිංචි ඡන්දදායකයින් | වලංගු ඡන්ද | ප්‍රතික්ෂේපිත ඡන්ද | මුලු ඡන්ද | ඡන්ද මධ්‍යස්ථාන |
| 1982 | සැප්තැම්බර් 17 | දින 34 | ඔක්තෝබර් 20 | 81.06% | 52.91% | 8,145,015 | 6,522,147 | 80,470 | 6,602,617 | 6985 |
| 1988 | නොවැම්බර් 10 | දින 40 | දෙසැම්බර් 19 | 55.32% | 50.43% | 9,375,742 | 5,094,778 | 91,445 | 5,186,223 | 8060 |
| 1994 | ඔක්තෝබර් 07 | දින 34 | නොවැම්බර් 09 | 70.47% | 62.28% | 10,945,065 | 7,561,526 | 151,706 | 7,713,232 | 9580 |
| 1999 | නොවැම්බර් 16 | දින 36 | දෙසැම්බර් 21 | 73.31% | 51.12% | 11,779,200 | 8,435,754 | 199,536 | 8,635,290 | 9,912 |
| 2005 | ඔක්තෝබර් 07 | දින 41 | නොවැම්බර් 17 | 73.73% | 50.29% | 13,327,160 | 9,717,039 | 109,739 | 9,826,778 | 10,748 |
| 2010 | දෙසැම්බර් 17 | දින 41 | ජනවාරි 26 | 74.50% | 57.88% | 14,088,500 | 10,393,613 | 101,838 | 10,495,451 | 11,134 |
| 2015 | දෙසැම්බර් 08 | දින 32 | ජනවාරි 08 | 81.52% | 51.28% | 15,044,490 | 12,123,452 | 140,925 | 12,264,377 | 12,314 |
| 2019 | ඔක්තෝබර් 07 | දින 41 | නොවැම්බර් 16 | 83.72% | 52.25% | 15,992,096 | 13,252,499 | 135,452 | 13,387,951 | 12,845 |

PAFFREL

## ජනාධිපති අපේක්ෂකයෙකුවීමට සුදුසුකම් (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 92 ව්‍යවස්ථාව)

1. ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචිවීමට සුදුසුකම් ඇති තැනැත්තෙකු වීම (ලියාපදිංචිවීම අවශ්‍ය නොවේ.)

2. වයස අවුරුදු 30 සම්පූර්ණ කර තිබීම

3. 91 වන ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීමට නුසුදුස්සෙකු නොවන කෙනෙකු වීම

4. දෙවරකට වඩා ජනාධිපති ධුරය දැරූ තැනැත්තෙකු නොවීම

5. 38(2) අනු ව්‍යවස්ථාවට අනුව දෝශාභියෝගයක් මගින් ජනාධිපති ධුරයෙන් ඉවත්කරනු ලැබ නොතිබීම

ඉහත සඳහන් කරුණු සම්පූර්ණ කරගත් ඕනෑම අයෙකුට ජනාධිපතිවරණය සඳහා තරඟවැදීමට ඉඩකඩ ඇති අතර ස්වාධීනව තරඟ කරන්නේ නම් පමණක් ඔහු හෝ ඇය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස සිටි හෝ සිටින අයෙකු විය යුතුය.

## ඇප මුදල් තැන්පත් කිරීම

නාම යෝජනා භාර ගන්නා දිනයට පෙර දින මධ්‍යහන 12.00 ට පෙර ඇප මුදල් තැන්පත් කළ යුතු අතර ස්වාධීන අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වන අපේක්ෂකයෙකු තමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස සිටි බවට / සිටින බවට තහවුරු කිරීමේ ලිපියක් පාර්ලිමේන්තු මහලේකම්වරයාගෙන් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයෙකුගේ වර්තමාන ඇප මුදල රුපියල් 50,000/= ක් වන අතර එය රුපියල් මිලියන 2.6 ක් දක්වා වැඩිකිරීමට කැබිනට් අනුමැතිය හිමිව ඇත.

ස්වාධීන පක්ෂයක අපේක්ෂකයෙකුගේ වර්තමාන ඇප මුදල රුපියල් 75,000/= ක් වන අතර එය රුපියල් මිලියන 3.1 ක් දක්වා වැඩිකිරීමට මේ වන විට කැබිනට් අනුමැතිය හිමිව ඇත.

ඉහත ඇප මුදල් සංශෝධන වලට අදාල යෝජනා 2024 අප්‍රේල් මස 08 වන දින කැබිනට් මණ්ඩලයේදී සම්මත වුවද මෙම ඇප මුදල් ඉදිරි මැතිවරණයේදී ක්‍රියාත්මක වන්නේ ඉදිරි ජනාධිපතිවරණයට නාමයෝජනා කැඳවීමට පෙර එය පාර්ලිමේන්තුවේදී සම්මතවී කතානායකවරයා විසින් සහතික කලහොත් පමණි.

## ඇප මුදල් වැඩිවීම ඉදිරි ජනාධිපතිවරණයේ හැඩතල කෙසේ වෙනස් කරයිද?

ජනාධිපතිවරණ අපේක්ෂකත්වය සඳහා ඇප මුදල් වැඩිකිරීමට ගනු ලැබූ තීන්දුව අප අගය කරමු. ඒ හරහා අනවශ්‍ය ලෙස හුදු පුද්ගලික ජනප්‍රියත්වයට ප්‍රධාන දේශපාලන පක්ෂවල මැතිවරණ ව්‍යාපාර වලට සහාය දීමට, ප්‍රධාන පක්ෂ වලට ඡන්දපොල නියෝජිතයින් ලබාදීමට හා මැතිවරණයෙන් අනතුරුව ජයග්‍රාහක පක්ෂයෙන් තනතුරු ලබාගැනීමට කරනු ලබන උත්සාහය මේ හරහා වැළකෙනු ඇත. එමෙන්ම මැතිවරණය සඳහා වැයවන මුදල්ද යම් ප්‍රමාණයක් මේ හරහා අවම කරගත හැකිය. පසුගිය මැතිවරණයේදී අපේක්ෂකයන් 35 තරඟ කළද ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා හැරුණු විට සෙසු අපේක්ෂකයන් සියලු දෙනාද එකතුව ලබාගෙන ඇත්තේ සියයට 2 කට අඩු ඡන්ද ප්‍රතිශතයකි. එහෙත් මෙම වැඩි කළ මුදල් ප්‍රමාණය සලකා බැලීමේදී ජයග්‍රහණය නොකළද කිසියම් දේශපාලන මතයක් නියෝජනය කරන එම මතය සමාජගත කිරීම සඳහා තරඟවදින දේශපාලන ධාරාවන්ට ගැටලුවක් විය හැකිය. ඇප මුදල රාජසන්තක වීම වළක්වා ගැනීමට නම් 2.5% ක ඡන්ද ප්‍රමාණයක් ලබාගත යුතු අතර එය දළ වශයෙන් ලක්ෂ 12 ක් ඉක්මවයි. එබැවින් බොහෝ දෙනාගෙඇප මුදල් රාජසන්තක වනු ඇත. එමෙන්ම කුඩා කුඩා කණ්ඩායම් යොදා ඡන්ද ගැනීමේ ව්‍යාපෘති මේ හරහා වැළකෙනු ඇත. එහෙත් තරඟවදින ව්‍යාපාරිකයින්ට මෙම මුදල ගැටලුවක් නොවනු ඇත.

PAFFREL

## පසුගිය ජනාධිපතිවරණ වල ප්‍රතිඵල පහත වගුවේ දැක්වේ.

**1982**

| | අපේක්ෂකයා | පක්ෂය | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය | පරාජය වූ අපේක්ෂකයින්ගේ එකතුවේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | ජේ.ආර් ජයවර්ධන | එක්සත් ජාතික පක්ෂය | 3,450,811 | 52.91% | 3071336 |
| | හෙක්ටර් කොබ්බෑකඩුව | ශ්‍රී ලංකා නිදහස් පක්ෂය | 2,548,438 | 39.07% | |
| | රෝහණ විජේවීර | ජනතා විමුක්ති පෙරමුණ | 273,428 | 4.19% | **47.0908736%** |
| | සෙසු අපේක්ෂකයින් | 3 | 249,470 | 3.83% | |

**1988**

| | අපේක්ෂකයා | පක්ෂය | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය | පරාජය වූ අපේක්ෂකයින්ගේ එකතුවේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | රණසිංහ ප්‍රේමදාස | එක්සත් ජාතික පක්ෂය | 2,569,199 | 50.43% | 2,525,679 |
| | සිරිමාවෝ බණ්ඩාරනායක | ශ්‍රී ලංකා නිදහස් පක්ෂය | 2,289,960 | 44.95% | **49.5729044%** |
| | ඔසී අබේගුණසේකර | ශ්‍රී ලංකා මහජන පක්ෂය | 235,719 | 4.63% | |

**1994**

| | අපේක්ෂකයා | පක්ෂය | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය | පරාජය වූ අපේක්ෂකයින්ගේ එකතුවේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | චන්ද්‍රිකා කුමාරතුංග | පොදුජන එක්සත් පෙරමුණ | 4,709,205 | 62.28% | 2,852,323 |
| | ශ්‍රීමා දිසානායක | එක්සත් ජාතික පක්ෂය | 2,715,285 | 35.91% | **37.72152605%** |
| | සෙසු අපේක්ෂකයින් | 4 | 136,858 | 1.81% | |

| | අපේක්ෂකයා | පක්ෂය | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය | පරාජය වූ අපේක්ෂකයින්ගේ එකතුවේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | චන්ද්‍රිකා කුමාරතුංග | පොදුජන එක්සත් පෙරමුණ | 4,312,157 | 51.12% | |
| | රනිල් වික්‍රමසිංහ | එක්සත් ජාතික පක්ෂය | 3,602,748 | 42.71% | 4,123,597 |
| | නන්දන ගුණතිලක | ජනතා විමුක්ති පෙරමුණ | 344,173 | 4.08% | |
| | සෙසු අපේක්ෂකයින් | 10 | 176,676 | 2.11% | **48.88237613%** |

**2005**

| | අපේක්ෂකයා | පක්ෂය | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය | පරාජය වූ අපේක්ෂකයින්ගේ එකතුවේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | මහින්ද රාජපක්ෂ | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 4,887,152 | 50.29% | 4,823,530 |
| | රනිල් වික්‍රමසිංහ | එක්සත් ජාතික පක්ෂය | 4,706,366 | 48.43% | |
| | සෙසු අපේක්ෂකයින් | 10 | 117,164 | 1.21% | **49.63991603%** |

| 2010 | | | | | |
|---|---|---|---|---|---|
| | අපේක්ෂකයා | පක්ෂය | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය | පරාජය වූ අපේක්ෂකයින්ගේ එකතුවේ ප්‍රතිශතය |
| | මහින්ද රාජපක්ෂ | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 6,015,934 | 57.88% | 4,377,679 |
| | සරත් ෆොන්සේකා | නව ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය | 4,173,185 | 40.15% | **42.118934%** |
| | සෙසු අපේක්ෂකයින් | 20 | 202,694 | 1.97% | |

| 2015 | | | | | |
|---|---|---|---|---|---|
| | අපේක්ෂකයා | පක්ෂය | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය | පරාජය වූ අපේක්ෂකයින්ගේ එකතුවේ ප්‍රතිශතය |
| | මෛත්‍රීපාල සිරිසේන | නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ | 6,217,162 | 51.28% | 5,906,290 |
| | මහින්ද රාජපක්ෂ | එක්සත් ජනතා නිදහස් සන්ධානය | 5,768,090 | 47.58% | **48.71788992%** |
| | සෙසු අපේක්ෂකයින් | 17 | 138,200 | 1.15% | |

| 2019 | | | | | |
|---|---|---|---|---|---|
| | අපේක්ෂකයා | පක්ෂය | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය | පරාජය වූ අපේක්ෂකයින්ගේ එකතුවේ ප්‍රතිශතය |
| | ගෝඨාභය රාජපක්ෂ | ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ | 6,924,255 | 52.25% | 6,328,244 |
| | සජිත් ප්‍රේමදාස | නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ | 5,564,239 | 41.99% | |
| | අනුර කුමාර දිසානායක | ජාතික ජන බල වේගය | 418,553 | 3.16% | **47.75%** |
| | සෙසු අපේක්ෂකයින් | 31 | 343,084 | 2.53% | |

## ජනාධිපතිවරණයේ මනාප සළකුණු කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 94 ව්‍යවස්ථාව අනුව අපේක්ෂකයන් දෙදෙනෙකුට වඩා තරග කරන්නේ නම් දෙවන මනාපයද තිදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් තරග කරන්නේ නම් තෙවන මනාපයද සළකුණු කිරීම සඳහා ඡන්දදායකයන්ට අයිතිය ඇත්තේය. එහිදී ඔහු ඡන්දය ලබාදෙන අපේක්ෂකයාගේ නම හා සළකුණු ඉදිරියේ ඇති කොටුවෙහි 1 ඉලක්කම සළකුණු කිරීමෙන් ඡන්දය ලබාදිය හැකිය. මනාප ලබාදෙන්නේ නම් තමා කැමති අපේක්ෂකයන්ට ඒ ආකාරයටම අභිමතය පරිදි 2 හා 3 පිළිවෙලින් සටහන් කළ යුතුය.

## ජයග්‍රාහකයා තෝරාපත් කරගැනීම

## (1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත්කරගැනීමේ පනත)

සමස්ත ඡන්ද ප්‍රමාණය ගණනය කිරීමෙන් අනතුරුව මුලු වලංගු ඡන්ද ප්‍රමාණයෙන් 50% ක් සහ තවත් එක් ඡන්දයක් ලබාගත් අපේක්ෂයෙකු වේ නම් ඔහු හෝ ඇය ජයග්‍රාහකයා ලෙස ප්‍රකාශ කරනු ලබයි.

යම් හෙයකින් කිසිවකුටත් 50% ක් සහ තවත් එක් ඡන්දයක් හෝ ලබාගෙන නොමැති අවස්ථාවක දෙවන හා තෙවන මනාප ගණනය කිරීම කරනු ලබයි.

මෙහිදී පළමුවෙන්ම මැතිවරණ කොමිෂන් සභාව විසින් සියලුම අපේක්ෂකයන් සමස්ත ලංකාවෙන්ම ලබාගෙන ඇති ඡන්ද ප්‍රමාණ අනුව අවරෝහණ අනුපිළිවෙලට සකස්කරන ලද ලැයිස්තුවක් පිළියෙල කරනු ලැබේ. එම ලැයිස්තුවේ අංක 1ට ලංකාවේ වැඩිම ඡන්ද ලබාගත් අපේක්ෂකයා සිටිය යුතු අතර ලැයිස්තුවේ අවසානයේ සිටිය යුත්තේ ලංකාවේ අඩුම ඡන්ද ලබාගත් අපේක්ෂකයාගේ නමවේ. ඉන්පසු මැතිවරණ කොමිෂන් සභාව විසින් අපේක්ෂකයන් කණ්ඩායම් දෙකකට බෙදනු ලැබේ. පළමු

කණ්ඩායමම වනුයේ සමස්ත ලංකාවෙන්ම වැඩිම ඡන්ද ලබාගත් අපේක්ෂකයන් දෙදෙනායි. එම කණ්ඩායම නම්කරනු ලබන්නේ තරගයේ තවදුරටත් රැඳීසිටින අපේක්ෂකයන් (Remaining Candidates) ලෙසය. දෙවන කණ්ඩායම වන්නේ සෙසු සියලුම ජනාධිපති ධුර අපේක්ෂකයන්ය. ඔවුන් තරගයෙන් ඉවත්කරන ලද අපේක්ෂකයන් (Eliminate Candidates) වශයෙන් නම්කරනු ලැබේ.

අනතුරුව මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි දිවයින පුරා සිටින ගණන් කිරීමේ නිලධාරීන් තරගයේ තවදුරටත් රැඳීසිටින අපේක්ෂකයන් දෙදෙනාගේ ඡන්ද පත්‍රිකා පැකට්ටු පසෙක තබා සෙසු අපේක්ෂකයන්ගේ (පරාජිත අපේක්ෂකයන්) ඡන්ද පැකට්ටු පිළිවෙලින් විවෘත කර එම ඡන්ද පත්‍රිකා වල දෙවන හා තෙවන මනාප ඉහත තවදුරටත් තරගයේ රැඳීසිටින අපේක්ෂකයන් දෙදෙනාගෙන් කවුරු වෙනුවෙන් හෝ සළකුණු කර ඇත්නම් එය ඔවුන් දෙදෙනාගෙන් අදාල අපේක්ෂකයාගේ ඡන්ද සංඛ්‍යාවට එකතු කර වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් තැනැත්තා ජනාධිපතිවරයා ලෙස ප්‍රකාශයට පත්කරයි. කිසියම් අවස්ථාවකදී දෙදෙනා ලබාගත් ඡන්ද සංඛ්‍යාව සමාන වන විට මැතිවරණ කොමිෂන් සභාවේ අභිමතය පරිදි කුසපත් ඇදීමෙන් ජයග්‍රහණය කරන අපේක්ෂකයාට කොමිෂන් සභාව විසින් එක ඡන්දයක් ලබාදී ඔහු හෝ ඇය ජනාධිපති ලෙස ප්‍රකාශයට පත්කරනු ලබයි. එහිදී ජයග්‍රාහී අපේක්ෂකයා සියයට 50 ක් හා එක් ඡන්දයක් ලබානොගත්තද ඔහු හෝ ඇය ජනාධිපතිවරයා ලෙස තෝරාගනී.

## ජනාධිපතිවරණය නොපවත්වා මේ වසරේ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්විය හැකිද?

මෙම ලිපිය ආරම්භයේ සඳහන් කල පරිදි බහුතර ජනතාවක් කල්පනා කරනුයේ පාලකයන්ට අවශ්‍ය නම් මැතිවරණ කල්දැමිය හැකි බවයි. තමන්ට අවැසි මැතිවරණ ඔවුනට කැමති ආකාරයකට පැවැත්විය හැකි බවයි. බැලූ බැල්මට මෙය සත්‍ය ලෙස පෙනුනද එසේ ප්‍රමාද කළ සෑම අවස්ථාවකම ඒ සඳහා සුවිශේෂී වූ කරුණු බලපා තිබේ.

මේ මොහොතේ එවැනි සුවිශේෂී කරුණු කිසිවක් නොමැති අතර ජනාධිපතිවරණය 1982 සිට මේ දක්වා කිසිදු අවස්ථාවක ප්‍රමාද කර නොමැත. සිදුව ඇත්තේ කලින් තැබීම පමණකි. එබැවින් ජනාධිපතිවරණය නිශ්චිත ලෙසම ලිපිය ආරම්භයේ සඳහන් කර ඇති ආකාරයට එකී කාල රාමුව තුළ පැවැත්වෙනු ඇත. එහෙත් විසි වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(1) අනු ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ නිල කාලය 2020-08-20 දිනෙන් ආරම්භ වී වසර දෙකහාමාරක් ඉක්ම යාමෙන් අනතුරුව ඕනෑම මොහොතක පාර්ලිමේන්තුව විසුරුවාහැරීමේ බලය විධායක ජනාධිපතිවරයා සතුව ඇත. ඒ අනුව 2023 පෙබරවාරි මස 20 දිනෙන් පසුව 2025 අගෝස්තු මාසය දක්වා ඕනෑම මොහොතක පාර්ලිමේන්තුව විසුරුවාහැරීමේ බලය ජනාධිපතිවරයා සතුව ඇත. එවැනි අවස්ථාවක පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීමේ වගකීම මැතිවරණ කොමිෂන් සභාවට පැවරෙනු ඇත. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හරින්නේ නම් පාර්ලිමේන්තු විසුරුවන දිනය, නාමයෝජනා භාර ගැනීමේ කාලසීමාව, ඡන්ද විමසීම් පවත්වන හා නව පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම් දිනය ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත්කිරීම ජනාධිපතිවරයාගේ වගකීමකි. ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීමට පෙර පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන්නේ නම් ජනාධිපතිවරණයේ අවම කාලය (දින 16-28 - 44) හා පාර්ලිමේන්තු මැතිවරණයේ අවම කාලය (දින 17+35 = 52) යන දෙකෙහිම අවම කාල සැලකිල්ලට ගතහොත් පාර්ලිමේන්තු මැතිවරණය 2024 අගෝස්තු මස අවසන් සතියට පෙර සිදු කළ යුතුය. ඒ අනුව පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ජූලි මස 3 වන සතිය ඇතුළත සිදුකල යුතුය. පාර්ලිමේන්තු ඡන්ද විමසීමට ගතවන උපරිම කාලය (දින 17+49 = 66) හා ජනාධිපතිවරණයට ගතවන උපරිම කාලය (දින 21+42 = 63) සැලකිල්ලට ගතහොත් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම 2024 ජූනි මස පළමු සතිය තුළ කළ යුතුය. (මෙයට අමතරව කාලය හා දින නියම කිරීමේදී මැතිවරණ කොමිෂන් සභාවේ අභිමතයට අදාල කරුණු කිහිපයක්ද ඇති බව සිහිපත් කරමි.)

## <u>මැතිවරණ දෙක එකම දිනයක පැවැත්වීම</u>

ඡන්ද දෙකම එකම දිනයක පැවැත්වීමේ ඇති ප්‍රායෝගික අපහසුතා දැනටමත් මැතිවරණ කොමිෂන් සභාව මාධ්‍ය හරහා වරින් වර ප්‍රකාශයට පත්කර ඇත. එහෙත් නීතියේ ඒ පිළිබඳව සඳහනක් නොමැති අතර නීතිමය බාධාවක්ද ඇති බව නොපෙනේ. කලාපයේ රටවල් ගණනාවක් (තායිලන්තය, පිලිපීනය, ඉන්දුනීසියාව) එකම දිනක මැතිවරණ ගණනාවක් පවත්වා ඇත. ඉන්දුනීසියාවේ 2024 පෙබරවාරි 14 දින පැවති මැතිවරණයේදී ඡන්ද විමසීම් 5 ක් එකම දින පැවැත්වූ අතර ඡන්දදායකයන් මිලියන 204 ක් ඡන්ද මධ්‍යස්ථාන ලක්ෂ 2 කදී ඡන්දය භාවිත කළ අතර එක් ඡන්ද මධ්‍යස්ථානයකට සිටියේ ඡන්දදායකයන් 300 ක් පමණි. එමෙන්ම මැතිවරණ කටයුතු වලදී මැතිවරණ නිලධාරීන් 50 කට වැඩි ප්‍රමාණයක් මියගිය බවද වාර්තා විය. එබැවින් එකම දිනක මැතිවරණය පැවැත්වෙන්නේ නම් ඒ පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාව සමග සාකච්ඡා කර ප්‍රායෝගික දුෂ්කරතා සලකා බලා එකඟතාවයකින් අනතුරුව එය සිදු කළ යුතුය.

එහෙත් බලයේ සිටින දේශපාලන පක්ෂ දෙකෙහි බල අවශ්‍යතාව සාක්ෂාත් කරගැනීම සඳහා මැතිවරණ කොමිසමෙන් නොවිමසා ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කර දින  ආසන්නයේදීම පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කළහොත් මැතිවරණ කොමිෂන් සභාවට මැතිවරණ දෙක එකට පැවැත්වීම හැර විකල්පයක් නොවනු ඇත. සියලු පාර්ශව අතර විධිමත් සංවාද හා එකඟතා ඇතිකරගැනීමෙන් තොරව එවැනි බලකිරීමක් ප්‍රජාතන්ත්‍රවාදයට යහපත් නොවනු ඇත.

**රෝහණ හෙට්ටිආරච්චි**
**විධායක අධ්‍යක්ෂ - පැෆ්රල්**
**සභාපති - ආසියානු මැතිවරණ නිරීක්ෂණ ජාලය**
Mobile : +94777 590154
Email : rohana.paffrel@email.com